CR

ආචාර්ය

# ගරු කඹුරුපිටියේ වනරතන
# මහානායක

ස්වාමීන් වහන්සේගේ

# උපාධි ප්‍රදානෝත්සව දේශනය

**ගරු මහා සංඝයා වහන්ස,**

**කුලපතිතුමියනි,**

**උප කුලපතිතුමන් ඇතුළු ආචාර්ය මණ්ඩලයේ**

**මහත්ම මහත්මීනි,**

**සම්භාවනීය අමුත්තනි,**

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය ඇරඹීමෙන් අටවිසි වසරකට පත් මේ මොහොතේ මෙම උපාධි උත්සවයේ දේශනය පැවැත්වීමට ආරාධනය කිරීම පිළිබඳව කෘතඥතාව ප්‍රථමයෙන් පිරිනැමීම මගේ යුතුකම යැයි සිතමි. විද්‍යොදය නමින් එද 1959 වර්ෂයේ මෙම ආයතනය ඇරඹීමත් සමග මෙහි සේවයට බැඳී අද දක්වා ඒ සේවයට කැපවී සිටින කෙනෙකු වශයෙන් මා ලත් විශාල අත්දැකීමක් තිබේ. එසේම පසුගිය අටවිසි වසර තුළ මගේ ජීවිතයට මේ ආයතනයෙන් ලැබුණ ආලෝකයද සුලුපටු නොවේ.

විශ්වවිද්‍යාලය යන වචනය මෑතදී සිංහලට එක්වූවකි. 1921 වර්ෂයේ ලන්ඩන් විශ්ව විද්‍යාලයේ අනුබද්ධ ආයතනයක් ලෙස පිහිටවූ යුනිවසිටි කොලීජිය එද නම් කළේ සමස්ත ශාස්ත්‍ර ශාලාව යනුවෙනි. එය ස්වාධීන ආයතනයක්වත්ම විශ්වවිද්‍යාලය බවට පත්විය. විශ්වවිද්‍යාලයට සරසවිය යයිද කියති. එය තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන්ගේ කව් සේකරයෙන් ගත් සුන්දර වචනයකි. තක්සලාවේ දිසාපාමොක් ආචාර්යවරයා හඳුන්වන තැන සරසවි මඩුවේ ඇඳුරු යයි හැඳින්වූහ. ලෝකයේ පැරණිම විශ්වවිද්‍යාලය එයයි. එය බුද්ධ කාලයටත් පෙර සිට පැවතියේය.

සරසවිය හෙවත් සරස්වතිය ශාස්ත්‍රයට අධිපති දෙවඟන යයිද ඇයගේ ආසනය පියුම යයිද පැරණියෝ කීහ. ශාස්ත්‍රාභ්‍යාසය සඳහා පිරිසුදු චරිතයක් අවශ්‍යය යන ගුප්තාර්ථයක් එයින් ලබාදේ. විද්‍යාව හික්මීම ලබාදේයයි කීවේ ද එහෙයිනි. උගත්කමේ ලක්ෂණය විනීත භාවයයි. අදට මෙය කොතෙක් දුරට ගැලපේද යනු සිතා බැලීම වටී.

විවිධ ශාස්ත්‍රයන් ලොවට බිහිකළ මහා විද්වත්හු ඍෂිවරයෝ වූහ. ඍෂි යන්නෙහි තේරුම පර්යේෂකයා යනුයි. ඔවුහු ඒ සඳහා මුලු ජීවිතයම කැපකර සාහිත්‍යය, සංගීත, ආයුර්වේද, ධනුර්වේද, ජ්‍යොතිෂ, යනාදී ලොවට වැඩදායක සූ සැටක් කලාවන් බිහි කළහ. බුදුරජාණන් වහන්සේද ඍෂි නාමය දැරූහ. උන්වහන්සේ එවැනි නුවණැති ඍෂි වරුන්-ගෙන් සත්වෙනියා යයිද කියා තිබේ. තමන් වහන්සේ අවබෝධකරගත් ධර්මය විද්‍යාව-යයි වදරා එය අංග පසකින් යුක්ත බවද වදාළහ. දැකීම, දැනීම, සවිස්තර ඥානය එයින් ලබන විනිවිද යන නුවණ හා ප්‍රමෝදය හෙවත් ආලෝකය ඒ අංග පසයි.

කවර පර්යේෂකයකුට වුවද මේ කරුණු පස අත්‍යවශ්‍යය. මෙයින් දැකීම නම් මූලදීම මනසට පෙනියන කරුණුය. සමහර විට එය සත්‍යයම විය නොහැක. ඒ නිසා දෙවනුව ඒ දුටු දේ නැවත සිතා බලා දැනීම ඇති කර ගතයුතුය. එයට ඤාණයයයි කියත්. දත් දේ ඒ වූ පරිද්දෙන්ම නොපිළිගෙන එය සවිස්තරව සළකා බැලිය යුතුය. එයට ප්‍රඥාව යයි කියත්. ප්‍රඥාවට අනතුරුව සම්පූර්ණ නිගමනයට එළඹීමෙන් විද්‍යාව උපදවා ගතයුතුය. මෙහි විද්‍යාව නම් නොදැනීම නැති කොට ලබා ගන්නා විනිවිද යන ප්‍රඥාවයි. මේ කරුණු සතරින් අනතුරුව පස්වන වරට තෙමේ සත්‍යය අවබෝධකර ගත්තේය යන මහත් ආශ්-වාදයත් ප්‍රමෝදයත් ඇතිවේ. ඒ ප්‍රමෝදයට ආලෝකයයි කියත්. බුදුන් වහන්සේගේ බුද්ධ ඥානය මේ අංග පසින් යුක්ත විය. අද විද්‍යාව යයි කියනු ලබන ''සයන්ස්'' ඒකාන්ත නිගමනය නොවේ. ඊට පසුව සොයා ගන්නා කරුණකින් එය වෙනස්වන හෙයිනි.

මේ මූලධර්මය පදනම්කර ගත් ශ්‍රී ලංකාවේ පැරණි අධ්‍යාපන ආයතනය වූයේ මහා විහාරයයි. අභයගිරියද එවැනි විශ්වවිද්‍යාල තත්ත්වයේ ආයතනයකි. මේ ආයතන දෙකෙහි ශාඛා ලක්දිව ඒ ඒ ප්‍රදේශයන්හිත් විදේශයන්හිත් ඇතිවිය. ආන්ධ්‍රයේ තිබූ මහා විහාර ශාඛාව පිළිබඳ කීර්තිය කාශ්මීරය හා තදාසන්න ප්‍රදේශය පුරා පැවතියේය. අභයගිරි ශාඛාවක් ඉන්දුනීසියාවේද ඇතිවිය. එය සිංහල භික්ෂූන් සඳහාම කරවූ ආයතනයකි. ඉන්දියාවේ නාලන්ද, වික්‍රමශිලා ආදී පැරණි විශ්වවිද්‍යාලද හඳුන්වා ඇත්තේ මහාවිහාර නාමයෙනි.

අනුරාධපුර මහා විහාරය පැවති තත්ත්වය ක්‍රි. ව. පස්වන සියවසේ මෙරටට පැමිණි බුද්ධඝෝෂ හිමියන්හට පිළිපැදි ආකාරයෙන් අවබෝධකර ගත හැක. උන් වහන්සේ කෙතරම් උගතකු වුවද මහාවිහාරය විසින් පිළිගනු ලැබුයේ මාතෘකාවකට අනුව ග්‍රන්ථයක් ලියා පිටපත්

තුනකින් යුක්තව ඉදිරිපත් කිරීමෙන් පසු පරීක්ෂණ මණ්ඩලයක් මගින් එය පිළිගෙන ''අනුබද්ධ'' යන උපාධියද ප්‍රදනය කිරීමෙන් පසුවයි. එද මහා විහාරයේ අනුබද්ධ ආයතන කිහිපයක් විය. විවිධ විෂය හා සමයවාදීන්ගේ ග්‍රන්ථ ඇතුළත් මහා පුස්තකාලයක් ද විය. එය ග්‍රන්ථාකර පිරිවෙන නමින් හැඳින්වූහ. බුද්ධගොස් හිමියන්ගේ වාසස්ථානය වූයේද එයයි.

මේ තත්ත්වය කෝට්ටේ සමය තෙක්ම පැවතියේය. කෝට්ටේ යුගයේ විජයබාහු පිරිවෙණද, එවැනිම ආයතනයකි. එහි අධිපතිව වැඩවිසූ තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් ෂට් භාෂා පරමේශ්වරයයි කියතත් ඒ ෂට් භාෂාවන්ට සිංහල, දෙමළ, පාලි, සංස්කෘත, භාෂා අයත්වී නැත. උන් වහන්සේ ඒ භාෂාවන්හි ද කෙළ පැමිණ සිටි බව පඤ්චිකාප්‍රදීපය කියයි. මෙයම එහි තත්ත්වය කියාපායි. විදේශ ආක්‍රමණ නිසා පිරිහී ගිය ධර්ම ශාස්ත්‍ර-යන්හි නව ප්‍රබෝධයක් ඇතිවූයේ එකුන්වන සිය වසෙහි ඇතිවූ විද්‍යොදය, විද්‍යාලංකාර පිරිවෙන් නිසාය. මේ දෙපිරුවනට කාලීන මුහුණුවරක් දී එතෙක් මේ දිවයිනේ ඉංග්‍රීසි මාධ්‍යයෙන් වූ උසස් අධ්‍යාපනය සිංහලෙන්දීම සඳහාත් ඒවා විශ්වවිද්‍යාල තත්වයට එකල පැවති රජය විසින් පත්කරණ ලදී. නොයෙක් බාධක මැද්දේ පවත්වාගෙන ගිය මේ විශ්වවිද්‍යාල දෙකින් සුලු කාලයක් තුළ උසස් ප්‍රතිඵල ලබාදෙන ලදී.

1966 වර්ෂයෙහි විද්‍යොදය විශ්ව විද්‍යාලයෙහි ගෞරව උපාධි අපේක්ෂක පිරිසක් සමග මම පර්යේෂණ කටයුතු සඳහා ඉන්දියාවට ගියෙමි. මද්‍රාසි විශ්ව විද්‍යාලයට ගිය අපි එහි ආචාර්ය මණ්ඩලය විසින් පිළිගෙණ එවකට ඉතිහාස මහාචාර්යව අසූවන වියෙහි සිටි ශ්‍රී නිවාස ශාස්ත්‍රි මහතාට හඳුන්වාදෙනු ලැබීමු. එතුමා අපේ විශ්වවිද්‍යාලයේ ස්වභාෂා අධ්‍යාපනය පිළිබඳ තොරතුරු විමසා සතුටුව, ස්වභාෂා අධ්‍යාපනය අතින් ලංකාව ඉන්දියාවට වඩා ඉදිරියට ගොස් ඇතැයි ප්‍රශංසා කෙළේය.

රටක ඒ රටේ භාෂාව දියුණු කිරීමට ජාත්‍යන්තර භාෂාවන්ගෙන් ලියූ වැදගත් ග්‍රන්ථ පරිවර්තනය වියයුතුයි. විද්‍යොදය විශ්ව විද්‍යාලය ආරම්භ කළ කාලයෙහි එවැනි වැදගත් ග්‍රන්ථ රාශියක් සිංහලට නභා ප්‍රසිද්ධ කළ නමුත් ඒ වේගය දැනට බොහෝ දුරට හීනවී තිබේ. මෙය ස්වභාෂාවෙන් අධ්‍යාපනය ලබන්නාට බොහෝ අවාසිදයකය. විශේෂයෙන් විශ්වවිද්‍යාලයන්හි උපාධි අපේක්ෂකයන් ඉංග්‍රීසි වැනි ජාත්‍යන්තර භාෂා ඥානයද හොඳින් ලබාගත යුතුය. ඒ නිසා ස්වභාෂා ඥනය හීනකර ගතයුතු නොවේ. එමෙන්ම යම්කියි භාෂාවක් දියුණු කරලීමයි කියන්නේ විවිධ විෂයයන් ඒ භාෂාවෙන් හැදැරීමට පහසුකම් සැලැස්වීමයි. මෙය පාලක පක්ෂයේ අවධානය යොමුවිය යුත්තකි.

අධ්‍යාපනයේ පරමාර්ථ තුනකි. පෞද්ගලිකත්වය, සාමාජිකත්වය හා නිර්මාන ශක්තිය යනුවෙනි. මෙය විශ්වවිද්‍යාල ජීවිතයේදී ඉතා වැදගත්ය. උපාධි අපේක්ෂකයා පාඨශාලීය ශිෂ්‍යයකු නොවේ. අධ්‍යාපනයේ මුදුන් පෙත්තට නැගීමට සූදනම්වන ඔහු තමා ගැනත් අනතුරුව සමාජය ගැනත් සිහිකරමින් එයට හුරුපුරුදු විය යුතුය. ඔහු ඒ ලබන පුරුද්ද පාලන ක්ෂේත්‍රයේදි ප්‍රයෝජනවත් වේ. ඔහුගේ විශේෂ ලක්ෂණය වූ නිර්මාණ ශක්තියෙන් යුක්තවීම හා ගතානුගතිකත්වයට ඇබ්බැහිනොවූ බුද්ධිමත් විප්ලවාදියකු විය යුතුය. විප්ලවවාදියා යනු කලකෝලාහල කිරීම නොවන බවද අමතක නොකළ යුතුය.

අද මේ උපාධි ප්‍රදනෝත්සවයේදී උපාධි ලැබූ මේ වියතුන් ගැනද යමක් කිවයුතුය. මේ හැම දෙනම අනාගත සිහින දකිමින් සිටිති. අද පවත්නා ත්‍රස්තවාදය ඒ හැම අපේක්ෂා-වකටම බාධාකරය. ඒ බාධාවන්වද එරෙහිව ඔබේ බුද්ධියත් ශක්තියත් ඔබේ දියුණුවට මෙන්ම රටේත්, ජාතියේත්, ආගමේත් දියුණුවට යෙදීමට අධිෂ්ඨාන කරගන්නා ලෙස ඉල්ලමි.

මගේ මේ දේශනය ජාතික උසස් අධ්‍යාපන මණ්ඩලයේ සභාපතිව සිටි මහාචාර්ය ගුණපාල මලලසේකර මහතා කළ ප්‍රකාශයකින් අවසන් කරමි. ඒ මහතා මෙසේ කියයි. ''භෞතික විද්‍යාවන් ගේ දියුණුව නිසා නව නිපදවීම් දිනපතාම වාගේ කලඑළි බසියි. මේ භෞතික සංවර්ධනයත් සමග සාමාජික ජීවිතයද සීග්‍රයෙන් වෙනස්වනු දක්ක හැකිය. තව අවුරුදු විසිපහකින් අපට මුහුණ දීමට සිදුවන්නේ මුලුමණින් ම වෙනස්වූ ලෝකයකටය. සීග්‍රයෙන් වෙනස්වන සමාජයක ජීවත්වීමට අවශ්‍ය නම්‍යතාවත් එම සමාජයට අවශ්‍ය සේවයත් පිළිබඳ නිපුණත්වයත් ලබාදීම නූතන අධ්‍යාපනයේ අරමුණ විය යුතුයි.''

ඔබ සැමට ස්තුතියි!